අගමැති නිවසට ගිනිතැබුවේ කවුරුන්ද: පුවත්පත් දෙකක්, කෝණයන් දෙකක්?

රටේ පවත්නා ආර්ථික අර්බුදයට සහ රජයට විරෝධය පාමින් ජූලි 09, 2022 දින කොළඹ පැවති ජන විරෝධතාවයත් සමග, එදින රාත්‍රියේදී කොල්ලුපිටිය මල් පාරේ පිහිටි අගමැති රනිල් වික්‍රමසිංහගේ පෞද්ගලික නිවස්නයට යම් පිරිසක් ගිනි තබා හානි කිරීමේ සිදුවීම, පුළුල්ව මාධ්‍ය අවධානයට ලක්ව තිබිණි.

එහිදී එම ගිනි තැබීම සිදුකළේ කවුරුන්ද යන්න පිළිබඳව පුවත්පත් වාර්තා දෙකක් මගින් දක්වා තිබුණේ මෙලෙසිනි.

අරුණ (ජූලි 11, 2022) - "මල් පාරේ පිහිටි පෞද්ගලික නිවසට පැමිණි අරගලකරුවන් පිරිසක්"

දිනමිණ (ජූලි 11, 2022) - "කිසියම් මැර කණ්ඩායමක්"

ඔබේ අදහස?